# INSURANCE (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රක්ෂණ මූලධර්ම

රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ යුතු මූලධර්ම රක්ෂණ මූලධර්ම නම් වේ.

## රක්ෂණ මූලධර්ම

- රක්ෂ්‍ය හිමිකම
- උපරිම විශ්වාසය
- හානිපූර්ණය
- ආදේශනය
- දායකත්වය
- ආසන්න ම හේතුව

ClassWork.LK

# රක්ෂ්‍ය හිමිකම

යම් විෂය වස්තුවක් පැවතීමෙන් ආර්ථිකමය වාසියකුත්, එය අහිමිවීමෙන් ආර්ථිකමය අවාසියකුත් ඇති වන ඕනෑ ම දෙයක් සම්බන්ධව ඇති හිමිකම, රක්ෂ්‍ය හිමිකම වේ.

**නිදසුන් :**

- ස්වාමිපුරුෂයාගේ ජීවිතය පිළිබඳ භාර්යාවටත්, භාර්යාවගේ ජීවිතය පිළිබඳ ව ස්වාමියාටත් රක්ෂ්‍ය හිමිකමත් ඇත.

- යම් දේපළක නීත්‍යානුකූල අයිතිකරුට එම දේපළ පිළිබඳ ව රක්ෂ්‍ය හිමිකමක් ඇත. (තමාගේ මෝටර් රථය, ඉඩම් වැනි)

- ණය හිමියෙකුට ණය ගැතියෙකුගේ ජීවිතය තම ණය ප්‍රමාණය දක්වා රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

ClassWork.LK

# උපරිම විශ්වාසය

රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා සහ රක්ෂිතයා විසින් හෙළිදරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කිරීම උපරිම විශ්වාසය වේ.

# හානි පූර්ණය

යම් රක්ෂිත දේපළකට හානියක් වූ විට එම දේපළ යථා තත්ත්වයට පත්කර ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් පමණක් ගෙවීම හානි පූර්ණය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 40 ක් වටිනා මෝටර් රථය එම මුදලට ම රක්ෂණය කර ඇති අවස්ථාවක රු. ලක්ෂ 2.5 ක අලාභයක් සිදු වුව හොත් වන්දි වශයෙන් රු. ලක්ෂ 2.5 ක් පමණක් ලැබීම

ClassWork.LK

# දායකත්වය මූලධර්මය

යම් දේපළක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විටක එම දේපළට යම් හානියක් සිදු වූ විටක ඒ සඳහා සියලු ම රක්ෂණ සමාගම් අනුපාතික ව දායක වී වන්දි ගෙවීම දායකත්වය මූලධර්මය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 10 ක දේපළක් A, B හා C යන රක්ෂණ සමාගම් තුනක අනුපිළිවෙලින් ලක්ෂ 5, ලක්ෂ 3 හා ලක්ෂ 2 බැගින් රක්ෂණය කර ඇති විටක එම දේපළට රු. 100 000 ක හානියක් සිදු වුයේ නම් 5: 3: 2 අනුපාතයට A රු. 50 000 ක් ද රු. 30 000 ක් ද C රු. 20 000 ක් ද වශයෙන් වන්දියට දායක වේ.

Class Work LK

# ආදේශන මූලධර්මය

රක්ෂිත දේපළකට සිදු වූ හානියක දී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසු ව බාහිර පාර්ශ්වයන්ගෙන් රක්ෂිතයාට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයා පවරා ගැනීම ආදේශන මූලධර්මය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 50 කට රක්ෂණය කළ මෝටර් රථයකට සිදු වූ අනතුරකින් එම රථය මුළුමනින් ම විනාශ වුයේ නම්, රක්ෂණ සමාගම රු. ලක්ෂ 50 ම වන්දි වශයෙන් ගෙවන අතර මෝටර් රථයේ සුන්බුන් වටිනාකම පවරා ගනී.

ClassWork.LK

# ආසන්න ම හේතුව මූලධර්මය

රක්ෂිත දේපළකට හෝ ජීවිතයකට සිදු වූ හානියක දී එම හානිය සිදු වීමට හේතු කිහිපයක් බලපා ඇති විටෙක, හානිය සිදු වීමට බලපෑ ආසන්න ම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී ඇත්නම් පමණක් වන්දි ගෙවන බව ආසන්න ම හේතුව මූලධර්මයෙන් දැක්වේ.

**නිදසුන් :**

සොරබිය රක්ෂණ ඔප්පුවක් හිමි පුද්ගලයෙකුට තම නිවසට ගින්නකින් හානියක් සිදු වුව හොත් වන්දි ලබා ගත නො හැකි ය. එයට හේතුව හානිය සිදු වීමට බලපෑ හේතුව වන ගින්න සොරබිය රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී නො තිබීමයි.

ClassWork.LK

# ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් වැදගත් කරුණු

ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය හා ආසන්න ම හේතුව යන මූලධර්ම පමණක් අදාළ වේ. හානිපූර්ණ මූලධර්මය හා එයට අයත් උපමූලධර්ම වන දායකත්වය හා ආදේශනය යන මූලධර්ම ජීවිත රක්ෂණයට අදාළ නො වේ.

එයට හේතුව ජීවිතය හානි වීමෙන් හෝ අනතුරට පත් වීමෙන් වන හානිය මුදලින් මැනිය නො හැකි වීමත් එය යථා තත්ත්වයට පත් කළ නොහැකි වීමත් ය.

ජීවිත රක්ෂණයේ දී ඔප්පුවේ සඳහන් යම් නිශ්චිත වටිනාකමක් වන්දි වශයෙන් ප්‍රදානය කෙරේ.

ClassWork.LK

## ප්‍රතිරක්ෂණය

රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම ප්‍රතිරක්ෂණය ලෙස හඳුන්වයි. ප්‍රතිරක්ෂණය මගින් රක්ෂණ සමාගම්වල වගකීම විතැන් කළ හැකි නිසා රක්ෂිතයාගෙන් අය කරනු ලබන වාරික මුදල අඩු මට්ටමක පවතී.

## ප්‍රාරක්ෂණය

විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම හා අනතුරක් සිදු වූ විට තමන් භාරගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම් වන්දි ගෙවීම
ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura